# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1797/22 - 2013 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2013.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2011.

**2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත**

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2013 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 අගෝස්තු මස 08 වැනි දින අංක 1770/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දුම්කොළ නිෂ්පාදන (ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ) නියෝග තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. එම නියෝගවල 5 වැනි නියෝගයේ “සෑම සිගරට් පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක දෙපැත්තෙහිම මුද්‍රණය කළ යුතු අතර, එය එම පැකට්ටුවේ, පාර්සලයේ, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියේ ඉඩ ප්‍රමාණයෙන් සියයට අසූවකට (80%) වඩා අඩු නොවන ලෙස දෙපැත්තෙහිම මුද්‍රණය විය යුතු ය” යන වචන වෙනුවට “සෑම සිගරට් පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක දෙපැත්තෙහිම මුද්‍රණය කළ යුතු අතර එය පැකට්ටුවේ, පාර්සලයේ, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියේ ඉදිරිපස හා පිටුපස යන දෙපැත්තෙහි ඉහළ මතුපිට ප්‍රදේශයේ සියයට අසූවකට (80%) වඩා අඩු නොවන ලෙස දෙපැත්තෙහිම මුද්‍රණය විය යුතු ය” යන වචන මෙයින් ආදේශ කරනු ලැබේ ;

2. එම නියෝගවල 6 වැනි නියෝගයේ සෑම “පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් තුළ එම දුම්කොළ නිෂ්පාදනයෙහි අඩංගු නිකොටින්, තාර, ෆෝමැල්ඩිහයිඩ් හා අනෙකුත් විෂද්‍රව්‍ය ඇතුළුව” යන වචන වෙනුවට “සෑම පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් තුළ එම දුම්කොළ නිෂ්පාදනයෙහි අඩංගු නිකොටින් සහ තාර” යන වචන මෙයින් ආදේශ කරනු ලැබේ ;

3. එම නියෝගවල 7 වැනි නියෝගය “නිෂ්පාදිත දිනය, මාසය හා වර්ෂ සඳහන් විය යුතු ය.” යන වචන වෙනුවට “නිෂ්පාදිත දිනය, මාසය වර්ෂය සහ කල් ඉකුත්වීමේ දිනය සඳහන් විය යුතු ය” යන වචන මෙයින් ආදේශ කරනු ලැබේ ;

4. එම නියෝග වල 10 වැනි නියෝගයට පසුව පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්

   “ 11 ගැසට් නිවේදනය පළවූ දින සිට මාස 3ක් ඇතුළත සෑම දුම්කොළ නිෂ්පාදන ආනයනකරුවකු විසින් මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ස්ටිකර් ඇලවීම මගින් මෙම නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය.”

03-277


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 001562 — 485 (2013/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*